# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/61 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වන වගන්තිය යටතේ නියමය

(188 වන අධිකාර වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "ආරක්ෂිත ස්මාරක" වශයෙන් සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය ප්‍රකාරව 2017 මාර්තු මස 20 වැනි දින අංක 2011/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදී.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

***උපලේඛනය***

***ප්‍රකාශයට පත් කරනු ලබන ආරක්ෂිත ස්මාරක ලේඛනය***

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1605 තඹකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හිඹුඩාව ග්‍රාමයට අයත් දික්වෙල මාර්ගයේ අංක 03, කෝවිල්කන්ද නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි චෛත්‍ය ගොඩැල්ල හා ගොඩනැගිලි නටඹුන් ස්ථාන තුන.

1A - G 37670 — 08 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1352 දිග්ගලගෙදර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පඬාව ග්‍රාමයට අයත් කෝන්ගහමුලහේන, වෙහෙරගාවහේන *හෙවත්* කඳුරුගහමුලවත්ත නැමැති ඉඩමේ ඇති පැරණි නටඹුන් ගොඩැල්ල සහිත ගල්තලාව.

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 647 බණ්ඩාරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යටිවිල්ල ග්‍රාමයට අයත් කුරුවාලෙන රජමහා විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන.

4. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාකඳුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාකඳුර ග්‍රාමයට අයත් මොලමුරේ සොහොන් භූමිය.

5. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 09, කොටගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොටගම ග්‍රාමයට අයත් ගලේ විහාරය නමින් හඳුන්වන ගල්තලාව මත ඇති පැරණි නටඹුන් ගොඩැල්ල සහ බෝධි ප්‍රාකාරය.

6. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 14 බී, දිඹුල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දිඹුල්ගමුව ග්‍රාමයට අයත් කටාරම් කෙටූ ලෙන් දෙක.

7. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීනටිපන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නාවන්දල ග්‍රාමයට අයත් මොහොතජ්ජෑ වත්ත නමින් හඳුන්වන ස්ථානයේ ඇති කටාරම් කෙටූ ලෙන.

8. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිනිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හරිගල ග්‍රාමයට අයත් ඉද්දමල්පාන රජමහා විහාර භූමියේ ඇති පැරණි ආවාස ගෘහය.

9. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 146/බී, බෝධිමළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නාමල්දෙණිය ග්‍රාමයේ ඇති කටාරම් කෙටූ ලෙන.

10. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 324, කරපුටුගල දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කරපුටුගල ග්‍රාමයට අයත් ජයසිංහාරාමය පුරාණ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

11. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 279 බී, කිත්සිරිපුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කිත්සිරිපුර කීර්ති ශ්‍රී තේජෝවරාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

12. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාල්ල කොටුව තුළ ඇති පල්ලිය වීදියේ, වරිපනම් අංක 12 දරන ස්ථානයේ ඇති ඕලන්ද රෙපරමාදු දේවස්ථාන ගොඩනැගිල්ල සහ පැරණි සුසාන පුවරු සහිත භූමිය.

13. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, ගාල්ල කොටුව තුළ ඇති පල්ලිය වීදියේ, වරිපනම් අංක 20 දරන ස්ථානයේ පිහිටි ඇන්ග්ලිකන් දේවස්ථාන ගොඩනැගිල්ල.

14. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාල්ල කොටුව තුළ ඇති ප්‍රදීපාගාර වීදියේ, වරිපනම් අංක 32 දරන ස්ථානයේ ඇති මෙතෝදිස්ත දේවස්ථාන ගොඩනැගිල්ල.

15. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 ඩී, ගාලු කොටුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගාල්ල කොටුව තුළ ඇති සුධර්මාලය මාවතේ, අංක 07 දරන ස්ථානයේ ඇති සුධර්මාලය විහාර භූමියට අයත් ධර්මශාලාව.

16. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදෙශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 සී, කළුවැල්ල ග්‍රාම නිලධාරී වසමට අයත් කළුවැල්ල ග්‍රාමයේ පිහිටි ශ්‍රී වර්ධනාරාම පුරාණ විහාර භූමියේ ඇති පැරණි චෛත්‍ය, තොරණ හා ප්‍රාකාර බැම්ම, පැරණි ආවාස ගෘහය සහ සෝභී ගණින්නාන්සේගේ සොහොන් පුවරුව.

17. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 451 ඩී, බතීගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බතීගම ග්‍රාමයට අයත් ගුරුකන්ද විහාරය නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

18. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 324 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නූපේ ග්‍රාමයට අයත් කුමාරතුංග මාවතේ පිහිටා ඇති මාතර බෝධි ආරක්ෂක සභාවට අයත් "ජය නිවස" නමින් හඳුන්වන පැරණි ගොඩනැගිල්ල.

19. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 307 ඒ, අඹගස්පිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අඹගස්පිටිය ග්‍රාමයේ ඇති කටාරම් සහිත ලෙන.

20. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 70, ඉහළ කඳවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කඳවල ග්‍රාමයට අයත් සේනානායක වලව්ව නමින් හඳුන්වනු ලබන පැරණි ගොඩනැගිල්ල.

21. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 689, ඒ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මොරවින්න ග්‍රාමයට අයත් සුධර්මාරාම පුරාණ විහාර භූමියේ ඇති පැරණි ආවාස ගෘහ 02 සක්මන් මළුව.

22. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 228 ජී, මොල්ලිපොතාන උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තිස්සපුර ග්‍රාමයට අයත් ශ්‍රී අග්බෝ පුරාණ විහාර භූමියේ ඇති පැරණි දාගැබ, ගොඩනැගිලි නටඹුන් ස්ථාන සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක. (උතුරු අක්ෂාංශ $8^0$ 26' 59.2" හා නැගෙනහිර දේශාංශ $81^0$ 04' 14.7" දරන ස්ථානයේ)

23. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 228 එෆ් මොල්ලිපොතාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මොල්ලිපොතාන ග්‍රාමයට අයත් තිස්සපුර සාලියපුර මාර්ගයට යාබද කුඹුරු ඉඩමේ ඇති ශිලා පුවරුවලින් නිර්මාණය කර ඇති පැරණි ගොඩනැගිලි ස්ථානය. (උතුරු අක්ෂාංශ $8^0$ 25' 37.9" හා නැගෙනහිර දේශාංශ $81^0$ 03' 50.6" දරන ස්ථානයේ)

24. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සපුර යුනිට් 08 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි 08 පෙදෙස ග්‍රාමයට අයත් 4 ඇළ මාර්ගයේ පිහිටා ඇති අත්තාණී ශිලා ලේඛනය. (උතුරු අක්ෂාංශ $8^0$ 26' 41.7" හා නැගෙනහිර දේශාංශ $81^0$ 04' 23.2" දරන ස්ථානයේ)

25. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535, නුවරඑළිය ග්‍රාම නිලධාරී වසමේ, ලේඩි මැකලම් වීදියේ පිහිටි වරිපනම් අංක 23 හා 25 දරන ඇලතෝප් - කොටේජ් නමින් හඳුන්වනු ලබන පැරණි ගොඩනැගිල්ල.

26. උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, කරෙනගර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරෙනගර් දකුණු බටහිර J/25 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වේරප්පිට්ටි ග්‍රාමයේ (උතුරු අක්ෂාංශ $9^0$ 43' 50" හා නැගෙනහිර දේශාංශ $079^0$ 51' 45" දරන ස්ථානයේ) ඇති ගොඩනැගිලි, නටඹුන් සහ පුරාවිද්‍යාත්මක සාධක සහිත වෙහෙරපිටිය නටඹුන් ස්ථානය.

EOG 09 - 0360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.